museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 නොවැම්බර්

**MMCA ශ්‍රී ලංකා සිය ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහන සමඟ වැඩෙයි**

දේශීය නූතන හා සමකාලීන කලාව පිළිබඳව ගැඹුරු අවබෝධයක් හා ඇගයීමක් පෝෂණයකිරීම අරඹයා ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) ගන්නා නිර්භය පියවර ගැන අපි කවුරුත් දනිමු. MMCA ශ්‍රී ලංකා ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහන යනු එවැනි සුවිශේෂී මුලපිරීමක් වන අතර, එයින් බලාපොරොත්තු වන්නේ විවිධ පසුබිම්වල කලා ලෝලීන්, එකතුකරන්නන්, හා දානපතියන්ව දේශීය කලාවට හා කලාකරුවන්ට සහායවන අතරේ ගැඹුරු සංස්කෘතික ගමනක නියැලීමයි.

මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ කලා ආයතන ක්ෂේත්‍රයේ වැදගත් ඉදිරි පිම්මක් නිරූපණය කරයි. සාම්ප්‍රදායික ගැලරි සංචාරයකට එහා ගිය, ගැඹුරින් විඳිය හැකි ඉගෙනුම් අත්දැකීමක් ලබාදීම තුළින් කලාව හා එහි අනුග්‍රාහකයන් අතර ඇති පරතරය පියවීම එහි අරමුණ වේ.

MMCA ශ්‍රී ලංකා ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහනට ඇතුළත් විශේෂ ප්‍රතිලාභ මාලාවේ එක් අංගයක් ලෙස විශේෂයෙන් අභිරක්ෂණයකළ දින පහක නව දිල්ලි සංචාරයක් මෙම වසර මුලදී කෞතුකාගාරය විසින් සංවිධානය කරන ලදී. India Art Fair පැවැත්වුණ සමයේ සිදුවූ මෙම සංචාරය අතරතුර අනුග්‍රාහකයන්ට ඉන්දියානු කලා ක්ෂේත්‍රයට දායකවන හා එහි වෘත්තියේ යෙදෙන විශේෂ වෘත්තිකයන්, කලාකරුවන්, ගැලරිකරුවන්, එකතුකරන්නන්, හා අනෙක් අනුග්‍රාහකයින් කිහිප දෙනෙකු මුණගැසීමට අවස්ථාව ලැබුනේ ය. ඔවුන්ගේ දෙවැනි සංචාරය ලෙස වසර මැදදී යාපනයට ගිය MMCA ශ්‍රී ලංකාහි අනුග්‍රාහකයින්ට දේශීය හා ගෝලීය යන කලා ක්ෂේත්‍ර දෙකෙහි ම නාමයක් හදාගනිමින් සිටින යාපනය පදනම් කරගත්කලාකරුවන් හා ඔවුන්ගේ කලාකෘති පිළිබඳව ගැඹුරින් ඉගෙන ගැනීමට හැකිවුණේ ය.

MMCA ශ්‍රී ලංකා ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහන පිළිබඳව කතා කරමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, "කාලය හරහා ගමන් කිරීමේදී සමාජයේ සාරය පිළිබිඹු කරන ගැඹුරු කැඩපතක් ලෙස කලාව සේවය කරනවා. කොළඹ නගරය හා මුළු දිවයිනෙහි ම සංස්කෘතික අනන්‍යතාව සාරවත් කිරීමට වෙර දරන වැඩසටහනක් ලෙස ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහන MMCA ශ්‍රී ලංකාවට අප හඳුන්වා දෙන්නේ ඉහමත් ආඩම්බරයකින් හා උද්යෝගයකින්" යනුවෙනි. ඇය තවදුරටත් කියා සිටියේ, "මෙම වැඩසටහන,කෞතුකාගාරයක් ලෙස අප කරන කාර්යය මනාව අවබෝධකර ගැනීමට අනුග්‍රාහකයින්ට ඉඩ සලසන ඉගෙනීමේ

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

අවස්ථාවක් වෙන බව මට විශ්වාසයි. MMCA ශ්‍රී ලංකා යනු, අප රටේ කෞතුකාගාර දිහා බැලෙන ආකාරයෙන් මිදීමට කැපවී සිටින නව ආයතනයක්. කෞතුකාගාර යනු වෙනස හා සබැඳි අවකාශ වන අතර, එම ආයතන ඒවා පිහිටා ඇති ස්ථානවල තිබෙන සමාජ පිළිබිඹු කළ යුතුයි. කලාකරුවන්, ගැලරි, කලා වෘත්තිකයන්, හා ජාත්‍යන්තර කෞතුකාගාරවලට තමාව හඳුන්වා දෙන විශේෂයෙන් අභිරක්ෂිත චාරිකාවල කොටසක් වීමේ අවස්ථාව අනුග්‍රාහකයන්ට තිබෙනවා" කියා ය. එමෙන්ම, "මේවා ජීවිත කාලයට ම එක් වරක් ලැබෙන අත්දැකීම් ලෙස සැලකෙන අතර, ඊට සමගාමීව ශ්‍රී ලංකාවේ අපගේ කෞතුකාගාරය ගොඩනැගීමට ද ඒවා උපකාරී වෙනවා" යැයි පෙරේයිරා තවදුරටත් කීවා ය.

MMCA ශ්‍රී ලංකා ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහනට ඇතුළත් අනෙක් සුවිශේෂ අවස්ථාවලට කෞතුකාගාරයේ අභිරක්ෂකයන් විසින් මෙහෙයවන විශේෂයෙන් අභිරක්ෂණයකළ කලා සංචාර, දේශීය හා විදේශීය කලාකරුවන් මුණගැසිය හැකි විශේෂ වැඩසටහන්, සහ තම එකතුව ගොඩනැගීමට උනන්දු අයට කලාකෘති එකතුකිරීම පිළිබඳ දැනුම ලබා ගැනීමට උපකාර වන සුවිශේෂ අවස්ථා ද ඇතුළත් ය. මේවාට අමතරව වැඩසටහනෙන් ලැබෙන ප්‍රධාන ම ප්‍රතිලාභයක් වන්නේ ශ්‍රී ලංකාවේ කලා අධ්‍යාපනයට දායක වීමට හැකි වීමයි. අභිරක්ෂිත ප්‍රදර්ශන, පොදු වැඩසටහන්, හා තවත් විවිධ ව්‍යාප්ති උත්සාහයන් තුළින් කලා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ MMCA ශ්‍රී ලංකාහි මෙහෙවරට අනුග්‍රාහකයන් ක්‍රියාශීලීව දායකවනු ඇත.

MMCA ශ්‍රී ලංකා ආදි කර්තෘ අනුග්‍රාහක වැඩසටහන දියුණු වෙද්දී, එය ශ්‍රී ලංකාවේ සංස්කෘතික කර්මාන්තවල වර්ධනයට සැලකිය යුතු ලෙස දායකවනු ඇතැයි හා, අනුග්‍රාහකයන් අතර නූතන හා සමකාලීන කලාව පිළිබඳව ගෝලීය දෘෂ්ටිකෝණය ඔප නංවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීමට ඔබ කැමතිනම්, onella@mmca-srilanka.org හරහා MMCA ශ්‍රී ලංකාහි සංවර්ධන සහායක ඔනෙලා පෙරේරා සමඟ සම්බන්ධ වන්න.